


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ උඳුවප් අව තෙළෙස්වක තිථිය ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 22 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 ජනවාරි 11 සඳුදා



කාලතුරයේ සිත්වල දොරටුව ද්වාර අද පත්‍රය සමඟ

# ජනතාව නොමඟ යවන්න එපා සාධාරණව දේශපාලනය කරන්න

## ජනපති විපක්ෂයට කියයි



මහින්ද අලුත්ගෙදර

ජනතාව අතරට වැරදි මත ගෙන යන්නේ නැතිව සාධාරණව දේශපාලනයේ නිරත වන්නැයි විපක්ෂයෙන් ඉල්ලීමක් කරන බවද විපක්ෂය මෙන් පාදඩ දේශපාලනයකට තමා කිසිවිටෙකත් සූදානම් නොමැති බවද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.

බලය තිබියදී ගමට නොයන දේශපාලන චර්යාව වෙනස් කළ තමාට නීතිය මිස දේශපාලන පළි ගැනීම් නැති බව පෙන්වා දෙන ඒ මහතා පසුගිය කාලයේ සිදු කර තිබෙන වැරදිවලට දඬුවම් දීම නීතියට පැවරී ඇති කාර්යභාරයක් වන නමුත් ඒ සඳහා මැදිහත් වී කලින් රජය කළාක් මෙන් දේශපාලන පළි ගැනීම් කිරීමට තමා සූදානම් නැතැයි ද අවධාරණය කරයි.

පිට 6



# රත්රන් නිධියේ කැණීම්වලට කැබිනට් අනුමැතිය

වටිනාකම

සුභාෂිණී සේනානායක

ත්‍රිකුණාමලය සේරුවාවිල පිහිටි වර්ග කිලෝමීටර් 54ක පමණ වපසරියකින් යුත් බවට මේ වන විට හඳුනාගෙන ඇති රන් ආකරය සම්බන්ධයෙන් කඩිනමින් කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි.

අද (11) පැවැත්වෙන කැබිනට් මණ්ඩල රැස්වීමේදී මේ සම්බන්ධයෙන් දැනුම්වත් කරන බවද ඇමැතිවරයා කියා සිටියේය.




# ETI මූල්‍ය අධ්‍යක්ෂවරුන් කෝටි 1300ක් වංචා කරලා

## රජයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් හරිප්‍රියා ජයසුන්දර

...් සේනානායක සහ සිරන්ජනී කුමාරි

...යි ෆයිනෑන්ස් ලිමිටඩ් ආයතනය ... කර ඇති තැන්පතුවල මූල්‍ය වටි... රුපියල් කෝටි 1300 ද ඉක්මවන බව ...වන් අධිකරණයයට ඉදිරිපත් කර... ...පති දෙපාර්තමේන්තුව වෙනුවෙන් ...දක්වමින් රජයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ...ටර් ජනරාල් හරිප්‍රියා ජයසුන්දර මහත්මිය පෙරේදා (09) කියා සිටියාය.

ඊ.ටී.අයි ෆයිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරුන් මෙම මුදල් පෞද්ගලික සුඛ විහරණය සඳහා යොදා ගෙන ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කළ විමර්ශනවලදී අනාවරණ වී ඇති බව ද ජයසුන්දර මහත්මිය පැවසුවාය.

පිට 06

## පාස්කු දා ප්‍රහාරකයන්ට ආධාර දුන්නැයි

# ශ්‍රී ලාංකිකයන් 3කට ඇමෙරිකාවෙන් අධි චෝදනා

මහින්ද අලුත්ගෙදර

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ත්‍රස්ත කණ්ඩායමට ආධාර අනුබල දීමේ චෝදනාවට ශ්‍රී ලාංකිකයන් තිදෙනකුට එරෙහිව ඇමෙරිකානු අධිකරණයක් මගින් අධි චෝදනා ගොනු කර තිබේ.

පිට 06



ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා මහවැසි මැද ලාතුගලදී ගම සමග පිළිසඳරට එක් වෙමින්..

# බිත්තර නිෂ්පාදකයන්ගේ ගැටලුවලට කඩිනමින් විසඳුම් දෙන්න

## අගමැති මහින්දගෙන් රාජ්‍ය ඇමැතිට උපදෙස්



මහින්ද අලුත්ගෙදර

බිත්තර නිෂ්පාදකයන්ගේ ගැටලු සඳහා කඩිනමින් විසඳුම් දෙන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා රාජ්‍ය ඇමැතිවරයාට උපදෙස් දී තිබේ.

මහා පරිමාණ හා කුඩා පරිමාණ බිත්තර නිෂ්පාදකයන්ගේ ගැටලු විසඳීමට අගමැතිවරයා පෙරේදා (09) විෂය භාර රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත් මහතාට උපදෙස් දුන් අතර අන්තර්ජාල සූම් තාක්ෂණය ඔස්සේ මහා පරිමාණ හා කුඩා පරිමාණ බිත්තර නිෂ්පාදක සංගම් අධ්‍යක්ෂ මණ්ඩල සමග සාකච්ඡාවකට එක් වෙමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

පිට 06

# කොවිඩ් පාලනයෙන් බලගතු රටවලට වඩා අපි ඉදිරියෙන්



සුභාෂිණී සේනානායක

# සැනිටයිසර් නියාමනය කරනවා

පිට 06



# රක්ෂිතවල වැව් ප්‍රතිසංස්කරණය ආරම්භ වේ

පිට 06

මහර රැඳවූවන්

බස්නාහිර-හුදෙකලා පෙදෙස් හැර

පළමු පාසල් වාරය

# දේශීය සිනමාව රැක ගන්න දෙවසරක වැඩපිළිවෙළක්

අගමැති තීරණය කරයි

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ දේශීය සිනමාව රැක ගැනීම උදෙසා දෙවසරක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා තීරණය කරයි.